විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි - 05/2019 ඔබේ අංකය / உமது இல. / Your No. } .......................... දිනය / திகதி / Date } 2019.05 28

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

<u>වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් නිසි පරිදි අය නොකිරීම</u>

අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කලාප අධ්‍යාපන කාර්යාල ඇතුළු ආයතන මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන විශ්‍රාම වැටුප් අයදුම්පත් පරීක්ෂා කිරීමේ දී වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ලියාපදිංචි නොවීම හා දායක මුදල් අයකිරීම සිදු නොවූ අවස්ථා අනාවරණය වී ඇත. එසේම, ඇතැම් අවස්ථාවල නිලධාරිනියන් වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය ලබාගෙන ඇතත්, අංකය ලබාගත් දින සිට දායක මුදල් අය කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් අයදුම්පත ඉදිරිපත් කර ඇති අවස්ථාවන් රාශියක් විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමට අදාළ සම්මුඛ පරීක්ෂණවල දී අනාවරණය වී ඇත.

02. මාසික විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් නිසි පරිදි අයකර ඇති බව තහවුරු කළ ලිපිය ඉදිරිපත් කළ යුතු බැවින් එය නිකුත් කිරීම සඳහා පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේ දී අදාළ අයවීම් නිසි පරිදි සිදුව නොමැති බව හඳුනාගෙන පාරිතෝෂිකයෙන් එය අය කිරීමට ඉල්ලුම් කරන අවස්ථා ද වාර්තා වේ.

03. එබැවින්, විශ්‍රාම ගන්වනු ලබන නිලධාරීන්ට අදාළව විශ්‍රාම වැටුප් අයදුම්පත් සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පෙර අදාළ නිලධාරියා විසින් වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායකවී තිබේ ද, යන්න හා නිලධාරියාගෙන් නිසි පරිදි දායක මුදල් අයකර තිබේ ද, යන්න සහතික කර ගැනීමට කටයුතු කරන ලෙස ද, ඒ සම්බන්ධයෙන් අදාළ සියලුම නිලධාරින් දැනුම්වත් කරන ලෙස ද කාරුණිකව දන්වමි.

04.ඉහත උපදෙස් නොසළකා හැර තවදුරටත් දායක මුදල් අය නොකරගත් විශ්‍රාම වැටුප් අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන්නේ නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව ද අවධාරණය කරමි.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk